# الإسلام دين رسل الله (للجمعية)

# ඉස්ලාමය අල්ලාහ්ගේ දූතවරුන්ගේ ආගමයි.

# ඉස්ලාමය අල්ලාහ්ගේ දූතවරුන්ගේ ආගමයි.

ඉස්ලාමය යනු විශ්වයේ මැවුම්කරු වන එය පරිපාලනය කරන අල්ලාහ්ට ආදරයෙන් හා ගෞරවයෙන් යුතුව යටත් වීමය. ඔහුට අවනත වීමය. ඉස්ලාමයේ මූලික කරුණු වනුයේ අල්ලාහ් පිළිබඳ විශ්වාසය කිරීමය. එනම් ඔහු මැවුම්කරුය. ඔහු හැර සෙසු සියලු දෑ ඔහු විසින් මවනු ලැබූ දෑය. නැමදුමට වඩාත් සුදුස්සා සැබැවින්ම ඔහු පමණය. ඔහුට කිසිදු හවුල්කරුවකු නැත. ඔහු හැර සැබෑ ලෙස නැමදුම් ලබන්නට කිසිවකු නැත. ඔහුට අලංකාර නාම හා උසස් ගුණාංග ඇත. කිසිදු අඩුවකින් තොර වූ සියලු පරිපූර්ණත්ව ඔහු සතුය. ඔහු කිසිවකු ජනනය කළේ නැත. ඔහු ජනනය වූයේ ද නැත. ඔහුට කිසිදු සමානයක් හෝ උපමාවක් හෝ නැත. ඔහුගේ මැවීම්

අතරින් කිසිවක තුළ ඔහු වැඩම සිටින්නේ නැත. ආරූඪ වන්නේ ද නැත.

ඉස්ලාමය යනු අල්ලාහ්ගේ ආගමයි. එය හැර වෙනත් දහමක් උත්තරීතර අල්ලාහ් මිනිසුන්ගෙන් පිළිගන්නේ නැත. සියලුම වක්තෘවරු ගෙන ආ ධර්මය එයයි.

එමෙන්ම ඉස්ලාමයේ තවත් මූලික කරුණක් වනුයේ, සියලුම දූතවරුන් ගැන විශ්වාස කිරීමය. එනම් අල්ලාහ් තම ගැත්තන් වෙත තම නියෝග දන්වා සිටිනු පිණිස දූතවරුන් එවා ඇති බවත් ඔවුන් වෙත දේව ග්‍රන්ථ පහළ කර ඇති බවත් විශ්වාස කිරීමය. ඔවුන් අතරින් අවසාන දූතයා මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ය. එතුමාණන්ට පෙර පැවති දූතවරුන්ගේ පිළිවෙත් වෙනස් කර අවසන් දිව්‍ය පිළිවෙත සමග අල්ලාහ් එතුමාණන්ව එව්වේය. බලවත් සාධක මගින් අල්ලාහ් එතුමාණන්ව ශක්තිමත් කළේය. ඒ අතරින් වඩාත්ම බලවත්

සාධකය වූයේ ලෝවැසියන්ගේ පරමාධිපතිගේ ප්‍රකාශය වන ශුද්ධ අල් කුර්ආනයයි. මිනිස් වර්ගයා දැන සිටින වඩාත්ම උසස්තම ග්‍රන්ථයයි. එහි අන්තර්ගතය, වචන හා සැකැස්ම තුළ ප්‍රාතිහාර්යයන් ඇත. එහි මෙලොව හා මතුලොව සතුට ගෙන දෙන සත්‍යය මඟපෙන්වීම ද ඇත. එය පහළ කරනු ලැබූ ආරබි භාෂාවෙන්ම මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනය දක්වා එක් අකුරක් හෝ නොවෙනස්ව කිසිදු වෙනස් කිරීමකට භාජනය නොවී ආරක්ෂිතව පවතී.

ඉස්ලාමයේ මූලිකාංග අතරට මලක්වරුන් හෙවත් සුර දූතයින් පිළිබඳ විශ්වාස කිරීමත්, අවසන් දිනය පිළිබඳ විශ්වාස කිරීමත් ඇතුළත් වේ. එහිදී අල්ලාහ් මිනිසාගේ ක්‍රියාවන් පිළිබඳ ඔවුන්ගෙන් ප්‍රශ්න කරනු පිණිස මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔවුන්ගේ මිනීවලවල්වලින් ඔවුන්ව යළි

අවදි කරනු ඇත. එහෙයින් කවරෙකු දේව විශ්වාස කරන්නෙකු ලෙස සිටිමින් දැහැමි ක්‍රියාවන් සිදු කළේ ද ඔහුට ස්වර්ග උයනේ සදා සැපත ඇත. කවරෙකු ප්‍රතික්ෂේප කොට නපුරු ක්‍රියාවන් සිදු කළේ ද ඔහුට අපා ගින්නේ බරපතල දඬුවම ඇත. එමෙන්ම අල්ලාහ් නියම කළ යහපත හා අයහපත පිළිබඳ විශ්වාස කිරීමත් ඉස්ලාමයේ මූලිකාංග අතරින් නවත් කරුණකි.

සැබැවින්ම ඊසා (ජේසු) තුමා අල්ලාහ්ගේ ගැත්තකු බවත්, ඔහුගේ දූතයකු බවත් මුස්ලිම්වරු විශ්වාස කරන අතරම එතුමා අල්ලාහ්ගේ පුත්‍රයා බව විශ්වාස නොකරති. හේතුව අල්ලාහ් සර්වබලධාරී වන බැවින් ඔහුට සහකාරියක හෝ දරුවකුගේ අවශ්‍යතාව නොමැති බැවිනි. සැබැවින්ම ඊසා වක්තෘවරයකු බවත් අල්ලාහ් එතුමාට බොහෝ ප්‍රාතිහාර්යයන් පිරිනමා ඇති බවත් සැබැවින්ම අල්ලාහ්ට

පමණක් නැමදුම් කළ යුතුය, ඔහුට කිසිවකු ආදේශ නොකළ යුතුය යැයි එතුමා තම ජනයාට ඇරයුම් කිරීම උදෙසා අල්ලාහ් එතුමාව එවූ බවත් අල් කුර්ආනයේ අල්ලාහ් අපට දන්වා ඇත. එමෙන්ම ඊසා (ජේසු) තුමා තමන්ට නැමදුම් කරන මෙන් මිනිසුන්ගෙන් ඉල්ලීම් නො කළ අතර එතුමා පවා නැමදුම් ඉටු කළේ එතුමාගේ මැවුම්කරු වෙත පමණය.

ඉස්ලාමය සහජ ධර්මතාවට හා බුද්ධියට අනුකූල ආගමක් වන අතර සාමාන්‍ය බුද්ධියක් ඇත්තෙකු එය පිළිගනු ඇත. එය තම මැවීම්වලට මැවුම්කරු විසින් නීතිගත කළ පිළිවෙතකි. එය සමස්ත මිනිස් සංහතියේ සතුට හා යහපත ගෙන දෙන ධර්මයයි. ජාතියෙන් ජාතියට හෝ වර්ණයෙන් වර්ණයට හෝ වෙනස් වන්නක් නොවෙයි. සමස්ත මිනිස් සංහතිය එහි එක සමානය. ඉස්ලාමය තුළ කිසිවකු

තවත් කිසිවකුට ඔහුගේ දැහැමි ක්‍රියාවන්හි ප්‍රමාණයට මිස වෙනස් වන්නේ නැත.

බුද්ධිය ඇති සෑම මිනිසෙකුම, අල්ලාහ් පරමාධිපතියාණන් බවත්, ඉස්ලාමය දහම බවත්, මුහම්මද් තුමාණෝ දූතයාණන් බවත් විශ්වාස කිරීම අනිවාර්යය වේ. මෙම විෂයයෙහි මිනිසාට තේරීමේ අයිතියක් නැත. හේතුව සැබැවින්ම අල්ලාහ් දූතවරුන්ට කවර පිළිතුරක් පිරිනැමුවේ ද ඒ ගැන මළවුන් කෙරෙන් නැඟිටුවනු ලබන දිනියේ විමසනු ඇත. ඔහු දේවත්වය විශ්වාස කරන මුඃමින්වරයකු නම් ඔහුට අති මහත් ජයග්‍රහණය හා සාර්තකත්වය ඇත. නමුත් ඔහු දේවත්වය ප්‍රතික්ෂේපකයකු නම් ඔහුට පැහැදිලි පාඩුව ඇත.

කවරෙකු ඉස්ලාමය තුළට පිවිසීමට අපේක්ෂා කරන්නේ ද ඔහු "අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න

මුහම්මදන් රසූලුල්ලාහ් (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවිදෙකු නැති බවට මම සාක්ෂි දරමි. මුහම්මද් තුමාණන් අල්ලාහ්ගේ දූතයාණන් බවටත් මම සාක්ෂි දරමි)" යනුවෙන් එහි අර්ථය හොඳින් වටහා ගෙන ඒ ගැන විශ්වාස කරමින් පැවසිය යුතුයි. එමගින් මුස්ලිම්වරයකු බවට පත්වනු ඇත. පසුව අල්ලාහ් ඔහුට අනිවාර්යය කළ දෑ ක්‍රියාත්මක කරනු පිණිස ඉස්ලාමයේ ඉතිරි පිළිවෙත් ද ටිකෙන් ටික හැදෑරිය යුතුයි.

වැඩි විස්තර සඳහා: https://byenah.com/ar/discover-islam

# පටුන

ඉස්ලාමය අල්ලාහ්ගේ දූතවරුන්ගේ ආගමයි.........................2

si364v2.0 - 04/09/2026